# 1.1 ඉස්ලාමීය අකීදාව

ඉස්ලාමීය අකීදාව යනු මූලික විශ්වාසයන් ගැන සඳහන් කිරීමකි. ඉස්ලාමීය පරිභාෂයේ ස්ථිර වූ හා අවසාන වූ න්‍යායන් අනුව බිහිවූ ඉස්ලාමීය විශ්වාසයන් ආශ්‍රිත කරුණු ය. මේ කරුණු මිනිසා සම්පූර්ණයෙන් විශ්වාස කර, ඒ අනුව තම ජීවිතය හැඩගස්වා ගත යුතුයි. "අකායිද්" යන බහු වචනයෙන් ද මෙය සඳහන් කරනු ලබයි.

මිනිස් ජීවිතය සමහර විශ්වාසයන් අනුව හැඩගසන ලද්දකි. මේ අනුව ඉස්ලාමීය විශ්වාසය ලබා ඒ අනුව ක්‍රියා කළ අයෙකු ජයග්‍රහණය ලැබුවෙකුය. ඉස්ලාමීය අකීදාවන් කුර්ආනයෙන් හා හදීස් වලින් උපුටා ගන්නා ලද්දකි. හුදෙක් විශ්වාසයන්ගෙන් පමණක් නොව අකීදාව නැමදුම් ක්‍රියාකාරකම් ගුණාංගයන් හා ඉතා සමීප සම්බන්ධතාවක් උසුලයි.

නිදසුනක් වශයෙන් යම් කෙනෙකු පොළිය, හලාල් යයි පවසන්නෙහි ද ඔහු ඉස්ලාමීය අකීදාව ප්‍රතික්ෂේප කළ අයෙකු වන්නේ ය.

නබිතුමන්ගේ කාලවකවානුවේ ඉස්ලාමීය අකීදාව ඉතා පාරිශුද්ධ වූ තත්ත්වයක තිබිණි. නබිතුමාණෝ එය "මා හා මගේ සහාබාවරුන් පිළිපැදූ මග" යයි සඳහන් කළහ. මේ අනුව ඉස්ලාමීය අකීදා යනු නබිතුමාණන්ගේ හා සහාභාවරුන්ගේ මග පෙන්වීම යනුවෙන් කෙටියෙන් සඳහන් කළ හැකි ය.

ඉස්ලාමීය අකීදාවේ බොහෝ කොටස් අඩංගු ය. ඒ සියල්ල කුර්ආන් හා හදීස් කෙසේ පවසා ඇත් ද, එලෙස ම අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු වන්නේ ය. අපගේ ඉන්ද්‍රියයන්ට හා චින්තනයට පටහැනි වුව ද එලෙසින් ම පිළිපැදීම යුතුකමකි.

ඉස්ලාමීය අකීදාවෙහි අන්තර්ගතය පහත සඳහන් පරිදි සංස්කරණය කොට දැක්විය හැක.

1. අල්ලාහ් පිළිබඳ විශ්වාසය. (අල්ලාහ් සිටි)

   ඔහු ඒකයාය, යන්නට නිදසුන් :-

   අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමයෙන්, ගුණාංග, විශ්වය තුළ ඔහුගේ බලය හා මහිමයේ හෙළි දැක්වීම් යන අංශයන් සලකා බැලේ.

2. ස්වභාවදහමට පරිබාහිර ව පවතින නොදිස්වෙන ලෝකය පිළිබඳ විශ්වාසය - මෙහි දී මලායිකාවරුන් ඉබ්ලිස් සහ ෂෛතාන්ගේ අනිටු බලවේග ඇතුළු රූහ් (ආත්මය) පිළිබඳ විස්තර සලකා බැලේ.

3. සත්‍ය - අසත්‍ය, හොඳ - නරක, අනුමත කළ-නොකළ දෑ යනාදිය විස්තර කොට දැක්වීම සඳහා අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ ආගම් පිළිබඳ විස්තර.

4. මිහිපිට සත්‍යයෙහි ආරක්‍ෂකයන් හා සෘජු මාර්ගයෙහි ආලෝක ධාරාවන් වශයෙන් පෙනී සිටි නබිවරුන්, රසූල්වරුන් පිළිබඳ විශ්වාසය ඇතුළු කරුණු.

5. පරලොව පිළිබඳ විශ්වාසය-මෙහි කබ්ර් (මිනිවළ) බඅස් (යළි නැගිටීම) මහ්ෂර් (පරමාන්තයෙහි රොක්වීම) ස්වර්ග හා අපාය යන කරුණු ඇතුළත් වේ.

6. විශ්වය හා එහි පවත්නා සියලුම ජීවීන්ගේ ක්‍රමවත් බව හා ක්‍රියාකාරකම, සැලසුම් කෙරුණු කලා කද්ර් පිළිබඳ විශ්වාසය

ඉහත සඳහන් කරුණු ඉස්ලාමීය අකීදා ක්ෂේත්‍රයේ විද්වතුන් විසින් පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ ගොනු කොට දක්වා ඇත.

| | | |
|---|---|---|
| 1. අල්ඉලාහියියාත් | : | අල්ලාහ් පිළිබඳ විශ්වාසය, ඒ සම්බන්ධ කරුණු හා කලා කද්ර් මෙහි විමසා බලනු ලැබේ. |
| 2. අන් නුබුව්වත් | : | මෙහිලා නබිවරුන් රසූල්වරුන්, ඔවුන්ගේ ගුණාංග, ආගම්, ඇතුළුව දේවප්‍රියයන්, විස්මිතයන් සහ අද්භූත දෑ (මුඌජිසා සහ කරාමා) යන කරුණු සලකා බැලේ. |
| 3. අර්-රූහානියියාත් | : | භෞතික ලෝකයට හා ඉන්ද්‍රියයන්ට නොදිස්වන කරුණු මෙහි විස්තර කෙරේ.<br>නිද : මලායිකවරුන්, ජින්වරුන්, ෂෛතාන් සහ රූහ් (ආත්මය) |
| 4. අස්-සම්යියාත් | : | මෙහි පරලොව ජීවිතය හා සම්බන්ධ කරුණු සලකා බැලේ.<br>නිද : කබ්ර් ජීවිතය, ලෝක අවසාන පෙර නිමිති, බඅස් සහ මහ්ෂර් |

තව ද, ඉස්ලාමීය ඉතිහාසයේ පසු කාලීන ව මුස්ලිම් ප්‍රජාව තුළ හටගත් රාජ්‍යතාන්ත්‍රික ගැටලු පිටස්තර චින්තනයන්ගේ බලපෑම්, ආගමික නිකායන් හා ඇති වූ සම්බන්ධතා, විචාර බුද්ධියෙහි සීමාව ඉක්මවීම යනාදිය හේතුකොටගෙන අකීදාවෙහි චාම් බව අහිමි විය. එහි ප්‍රාණවත්භාවය හා ශ්‍රේෂ්ඨත්වය ද පහත වැටුණේ ය. අකීදාව හා සම්බන්ධ කරුණු හුදෙක් ම වාද විවාදවලට හා තර්ක විතර්කවලට සීමා විය.

සිත පිරිසිදු කොට මිනිසාගේ හැසිරීම සකසා මිනිසා හා ඔහු වෙසෙන සමාජය උතුම් තත්ත්වයකට පත් කළ යුතු ඊමානය හුදෙක් ම දාර්ශනික විමර්ශනයට ලක් වූ භාණ්ඩයක් බවට පත් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අකීදව කේන්ද්‍ර කොට ගෙන නොයෙකුත් චින්තන කොටස් බිහිවිය. කද්රියියා, ජබ්රියියා, මුර්ජිආ, කවාරිජ් ෂිආ සහ මුඃතසිලා යනාදිය නිදසුන් වේ. මේවා මගින් මිනිසා නොමග යවන චින්තන හා ප්‍රතිපත්ති ඉදිරිපත් කරන ලදී.

මේ තත්ත්වය තුළ ඉස්ලාමීය අකීදාවේ පවිත්‍රත්වය රැකීමෙහි ලා ඉමාම්වරු අගනා සේවයක් ලබා දුන්හ. ඔවුන් අතරින් අහ්මද්-ඉබිනු හන්බල්, අබුල්හසන් අල් අස්අරි-අබු මන්සූර් අල් මාදුරුඊදි, අබුජඌපර් අත් තහාවී යන අය සැලකිය යුත්තේ ය.

මොවුහු කුර්ආන් හා සුන්නාව ආශ්‍රිත ව උදාහරණ ඉදිරිපත් කිරීමෙන්, තර්කානුකූල විදහා දැක්වීමෙන් අස්සුන්නා වල් ජමාඅත් නමැති සැබෑ සංකල්පය සමාජයේ තහවුරු කළහ. අස්සුන්නා වල් ජමාඅත් යනු මුහම්මද් (සල්) නබිතුමාණන් ඔහුගේ සහභාවරුන් පෙන්වා දුන් ජීවන රටාව ය. අප ද එය පිළිපැද ජීවත් වන්නෙමු. එම නිසා ඉස්ලාම් පහදා දුන් ආකාරයට අකීදාව වටහා ගැනීම ඉස්ලාමයේ දේශනාවන්ට අනුව ජීවිතය හැඩගස්වා ගැනීම මුස්ලිම්වරයෙකු සතු වගකීමකි.

<u>අභ්‍යාසය</u>

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඉස්ලාමීය අකීද යනු කුමක් ද?
2. ඉස්ලාමීය අකීදවෙහි අන්තර්ගතය සඳහන් කරන්න.
3. පහත සඳහන් දෑ කෙටියෙන් විස්තර කරන්න.
   (අ) අල්- ඉලාහියියාත්
   (ආ) අන්- නුබුව්වාත්
   (ඇ) අර්- රූහානිය්‍යාත්
   (ඈ) අස්- සම්යියාත්
4. අකීදව කේන්ද්‍ර කොටගෙන පහළ වූ කොටස් සඳහන් කරන්න.
5. ඉස්ලාමීය අකීදවෙහි පවිත්‍රත්වය රැකගැනීම සඳහා කැපවූ ඉමාම්වරුන් නම් කරන්න.

## 1.2 අහ්ලුස්සුන්නාහ් වල් ජමාආවෙහි අකීදව

"ඉල්මුල් අකීදා" නැමැති ශාස්ත්‍රය ලෝකයෙහි පවත්නා අන් සියලු ශාස්ත්‍රයන්ට වඩා මුස්ලිම්වරයෙකුට උසස් වන්නේ ය. විශ්වයට අධිපති වූ අල්ලාහුතආලා හා ඔහුගේ දූත්, සිෆාත්, අස්මා සහ අෆ්ආල් ඇතුළුව මුස්ලිම්වරයෙකු විසින් විස්වාස කර පිළිපැදිය යුතු කරුණු ගැන විස්තර කරනු ලබන්නේ මෙම ශාස්ත්‍රයෙන්ය. රසූල්වරුන් විසින් ඉල්මුල් අකීදවෙහි අන්තර්ගතය ලබා දෙන ලදී. මිනිසා සතුව පවතින නොයෙකුත් තොරතරු හුවමාරු මාධ්‍ය හෝ උපකරණ හෝ ඔහු විසින් කරනු ලබන පර්යේෂණ මගින් මේ දැනුම ලබාගත නොහැක.

මුඃමින් වරයෙකුගේ දෙලොවෙහි ජයග්‍රහණය, ඉල්මුල් අකීදවේ නිවැරැදි දැනුම හා පැහැදිලි බව ලබා ගැනීමෙහි හා ඒ අනුව ක්‍රියා කිරීමෙහි රැඳී ඇති බව මුස්ලිම්වරයෙකුගේ විශ්වාසය යි. මක්නිසාද යත්, කෙනෙකු තමා කව්රුන්ද, තමාගේ ප්‍රභවය කුමක්ද, ස්වකීය අවසානය කුමක් ද මිහිපිට තමාගේ ස්ථානය කෙලෙසද, තමාගේ යුතුකම් කවරේද, යන මූලික කරුණුවලට විසඳුම රැඳී තිබෙන්නේ ඉල්මුල් අකීදවෙහිය.

අල්ලාහ් පිළිබඳ වසන් වූ කරුණු හා අනිකුත් කරුණු දැනගැනීමෙහිලා මිනිස් සමාජය තුළ කොටස් දෙකක් පැවතෙන්නේය. එක් කොටසක් නබිත්වය, රිසාලත් ඇතුළුව විශේෂිත දැනුම හා දේව මගපෙන්වීම ලැබූ රසූල්වරුන් ගැන විශ්වාසය තැබූහ. ඒ මන්දයත්, ඉහත කී මෙහෙවර සඳහා රසූල්වරුන්, අල්ලාහුතආලා විසින් තෝරාගන්නා ලදි. ඔවුන්ව අල්ලාහ් සහ ඔහුගේ ප්‍රියමනාපය ලබා ගන්නේ කෙසේද ? යැයි පෙන්වා දීමට යවනු ලැබුවෝය. මේ සඳහා අවශ්‍ය තියුණු බුද්ධිය හා මගපෙන්වීම අල්ලාහ් ඔවුන්ට ලබා දුන්නේය. අල්ලාහ්ගේ රසූල්වරයෙකු වූ ඉබ්‍රාහිම් (අලෛ) ගැන කුර්ආනය මෙසේ විස්තර කරයි.

"අහස් තලයන්හි හා පොළෝ තලයන්හි අපගේ පාලනය ඉබ්‍රාහිම්ට පෙන්වා දුන්නෙමු. ඔහු ස්ථානවරත්වය ලැබූවුවන්ගෙන් කෙනෙකු වීමට මෙසේ කළෙමු." (6: 75)

තවද, ඉබ්‍රාහිම් නබි (අලෛ) තුමාගෙන් ඔහුගේ සමාජය, දැනුම හා පැහැදිලි භාවයෙන් තොරව තර්ක කළ විට ඔවුන්ට එතුමා ලබාදුන් පිළිතුරු ගැනද අල්කුර්ආනය මෙසේ පවසයි.

"තවද, (මේ ගැන) ඔහුගේ උම්මතයන් තර්ක කළහ. එයට ඔහු ඔබලා අල්ලාහ් ගැනද මා සමග විවාද කරන්නේ ඔහු මට නිසි මාර්ගය පෙන්වා දුන්නේය." (6: 80)

ඉහත කී පළමු පිරිස නබිවරුන්ගේ මග පෙන්වීම සමඟ තමන්ගේ ඥානය හා චිත්ත පාරිශුද්ධත්වය මගින් ඊමානය ශක්තිමත් කරගත්හ.

තව පිරිසක් හුදෙක්ම ස්වකීය බුද්ධිය, තීක්ෂණභාවය, පළපුරුදුකම්, පරීක්ෂණයන් යනාදියෙන් පමණක් දෙවියන් වහන්සේ හා අනිකුත් වසන් වූ කරුණු තේරුම් ගැනීමට පෙළඹුනාහ. මොවුන් රසායන පදාර්ථයක් හෝ ස්වාභාවික වූ ශක්තියක්, පරීක්ෂණයට ලක් කරනවා මෙන් අල්ලාහ් හා ඔහුගේ දූත්, සිෆාත් ද පරීක්ෂණයට ලක් කිරීමට පෙළඹුණහ. මෙම ක්ෂේත්‍රයෙහි ඉදිරියෙන් සිටියේ ග්‍රීක දේවවාදී පර්යේෂකයන්ය. කිසිදු දේව මඟපෙන්වීමක් නොලැබූ මොවුන්, තමන්ගේ ඥානය හා පර්යේෂණයන්හි පමනක් එල්බ සිට දේව ස්වභාවය පිළිබඳ විවිධ සිද්ධාන්ත හා සංකල්පනයන් ඉදිරිපත් කළහ. අනිකුත් සමාජයන්හි බුද්ධිමතුන් හා පර්යේෂකයන් මොවුන්ව අනුගාමිකයන් ලෙස සලකා පිළිපදින්නට වූහ. පවිත්‍ර හා සම්පූර්ණ වූ ආගමක් ලැබූ මුස්ලිම්වරුන් සමහරක් ද ග්‍රීක සිද්ධාන්තයන්ගෙන් ආකර්ෂණයට පත්ව එම සිද්ධාන්තයෙහි එක් දෘෂ්ටි කෝණයෙන් ඉස්ලාමීය අකීදවද පර්යේෂණයට ලක් කිරීමට ඉදිරිපත්වීම කණගාටුවට කරුණකි. මොවුන් අතුරෙන් යහපත් අරමුණු ඇත්තෝද සිටියහ. එලෙසම අයහපත් වුවෝද සිටියහ. ඊමානයෙහි ප්‍රබලයන්ද වූහ. කෙසේ නමුදු මෙම ප්‍රවනතාවය ඉස්ලාමීය අකීදවෙහි පාරිශුද්ධත්වයට බලපෑම් ඇති කළේය. මෙනිසා ඉස්ලාමීය විශ්වාසයන් පිළිබඳ පරස්පර විරෝධී තත්ත්වයන් හට ගැනුණි. මුඃතසිලාවරු, කදරියියාවරු, ජබරියියාවරු, මුර්ජිආවරු, භාතිනිවරු වැනි විවිධ කොටස් බිහිවීමට හේතුවිය.

මේ තත්ත්වය තුළ සහාභාවරුන් හා සලෆුස්සාලිහීන්වරුන් පිළිපැදි පිවිතුරු ඉස්ලාමීය අකීදව වන අහ්ලුස්සුන්නාහ් වල්ජමාආ නමැති සංකල්පය ආරක්‍ෂා කිරීමට හා ජනතාවට කියා දීමට මිනිස්සු අවශ්‍ය වූහ. මෙම වකවානුවේදී ග්‍රීක සිද්ධාන්තයන් පිටුදැක, කුර්ආන් හා සුන්නාව පාදක කොටගත් ඉස්ලාමීය අකීදවෙහි සත්‍යභාවය හා පවිත්‍රත්වය විස්තර කිරීමට හැකි බොහෝ විද්වතුන් මුස්ලිම් උම්මාවෙහි බිහිවූහ. මොවුන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාමීය විශ්වාසයේ පිවිතුරු බව ආරක්‍ෂා කරන ලද අතර කලකට පසු එය ශාස්ත්‍රයක් බවට වර්ධනය විය.

## අහ්ලුස් සුන්නාහ් වල් ජමාආ අකීද වේ සාරාංශය

### අල්ලාහ්

ලොවෙහි මැවුම්කරු අල්ලාහ්ය. ඔහුට ආරම්භයක් හෝ අවසානයක් ද නැත. පරිපූර්ණත්වයේ සියළු ගුණාංගයන්ගෙන් සහිත වූ ඔහු සියලු අඩුපාඩු වලින් මිදී සිටින පවිත්‍රයාය, සර්වඥයාය: සියලු ද කෙරෙහි බලසම්පන්නයාය: සිය අභිමතය පරිදි නිදහස්ව ක්‍රියා කරන්නාය: නිත්‍ය ජීවියාය, ශ්‍රාවණය කරන්නාය: දෘෂ්ටිකයාය: ඔහුට සමානව කිසිවකු හෝ කිසිවක් ද නොමැත: නැමදුමට සුදුස්සාය: ලෙඩ රෝග සුවකරන්නාය: ආහාර පාන හා සියලු සම්පත් ලබා දෙන්නාය: දුක් කරදර ඉවත් කරන්නාය: යම් දෙයක් ගැන ඔහු අභිමත වූවේ නම්, "වනු" (කුන්) යනුවෙන් කීම ඔහුට ප්‍රමාණවත්ය: එවිට එය සිදුවන්නේය. කිසිම දෙයක් තුළ ඔහු රැඳී නොහිටී: කිසිම දෙයක් හා ඔහු සම්බන්ධ නොවේ: සංකලනය ද නොවේ: එහු ස්වයංව ස්ථාපිතයි: ඔහු පදාර්ථයක් හෝ ද්‍රව්‍යක් සේම ස්ථූලයක් ද නොවේ: ඕනෑ එපාකම් ඔහුට නැත: මූඃමින්වරු පරමාන්තයෙහි ඔහුව දැක බලාගැනීමට භාග්‍ය ලද්දෝය.

කුසල් අකුසල් යනාදී සියල්ල ඔහුගේ කැමැත්ත හා අභිමතය පරිදි සිදුවේ. තවද, සිදුවූ හා සිදුවෙන්නට ඇති සියල්ලද ඔහුගේ අභිමතය, සැලසුම හා ප්‍රඥව පරිදිම සිදුවේ.

### මලායිකාවරු :

අල්ලාහ් විසින් මලායිකාවරුන් මවනු ලැබුවේය. අල්ලාහ්ගේ අණ පරිදි මොවුහු අල්ලාහ්ගේ ගැත්තන්ගේ යහපත තකා කටයුතුවල නිරතවී සිටිති. අහස් තලයන්හි හා මහ පොලොවෙහි නොයෙකුත් කාර්යයන්හි නියැලී සිටිති. අල්ලාහ්ගේ මැවුම් අතර, ෂෙයිතාන් හා ජින්වරුන් ද සිටිති.

### අල් කුර්ආනය :

මෙය අල්ලාහ්ගේ කලාමය වේ. අල්කුර්ආනයට පෙර නොයෙකුත් දේව ඇදහිලි තිබිණි. ඒ සියල්ල අල්කුර්ආනය පහළවීමත් සමඟ අවලංගුභාවයට පත්විය.

### පරමාන්තය :

මරණයෙන් පසු තව ජීවිතයක් තිබේ. පරලොව යනු සැබෑවකි. එහි යුක්ති විනිශ්චය සිදුවීමත් සැබෑවකි. සිරාත්, මීසාන්, ස්වර්ගය, නිරය යනාදිය ද සැබෑවකි. ඒවා මන ලද්දේය, රූහ්, මිනිසාගෙන් වෙන්වූව ද විනාශ නොවන ඒවාය. නමුත් ඒවාටද ආරම්භයක් ඇත.

### අකුසල් :

මහා පාපකර්මවල යෙදිසිටින මුස්ලිම් පාපිෂ්ඨයෙක්ය. නමුත් කාෆිර්වරයෙකු නොවන්නේය. මෙවන් කෙනෙකු නිරයට යවනු ලැබුවේද එහි සඳහට රැඳී නොසිටී. පාපයන්වල යෙදී සිටිනක මූඃමින්වරයෙකු අල්ලාහ්ගේ අභිමතය පරිදි සමාව ලබාදී ස්වර්ගයට යවනු ලබයි. නැතහොත් දඬුවම් කරනු ලැබ පසුව ස්වර්ගයට යවනු ලබයි.

කුෆ්ර් හා ෂිර්ක් යනාදිය ඇති කරන ක්‍රියාවන්හි නිරත නොවන තත්ත්වයෙන් මුස්ලිම් කෙනෙකුට කාෆිර් යයි කීම බරපතල වරදකි. පාපයක්, වරදක් ලෙස නො සැලකීමත්, හරාම් වූ දෙයක් හරාම් නොවන ලෙස සැලකීමත් කුෆ්ර් තත්ත්වය ඇති කරයි. ෂරීඅතය නිගාවට ලක්කිරීම ද කුෆ්රය ඇති කරයි.

ෂෆාඅත් නැමැති දෙයක් ඇත. අල්ලාහ්ගේ අනු දැනුම ඇතිව පරමාන්තයෙහි සමහරුන් තවත් සමහරුන් වෙනුවෙන් මැදිහත්වීමට භාග්‍ය ලබන්නේය. නබි (සල්) තුමන් තමාගේ උම්මතය වෙනුවෙන් පරමාන්තයෙහි විශේෂ ෂෆාඅතයක යෙදෙති.

කබ්රය තුළ වේදනා ඇත. මූඃමින්වරයෙකු කබ්රය තුළ සැප විඳින්නේය යන්නද සත්‍යය. කබ්රයෙහි මුන්කර් හා නකීර් යන මලාඉකාවරුන්ගේ ප්‍රශ්න කිරීම සිදුවන බවද සත්‍යයකි.

## රිසාලත්

මිනිස් සමාජයට යහමග පෙන්වීමෙහි ලා කලින් කලට රසූල්වරුන් හා නබිවරුන් යවන ලද බව සත්‍යයකි. මොවුන් මගින් අල්ලාහ්, තම ගැත්තන්ට නොයෙකුත් ආඥාවන් හා තහනම් නියෝග ලබා දුන් බවද සත්‍යයකි. ඔවුන් මිනිසුන් සමඟ සසඳන කල සුවිශේෂි ගුණාංග රැසක් ලබා සිටියහ. "මූඃජිසාත්" නැමති හාස්කම්, ගති ලක්ෂණ, උසස් ගුණාංගයන්, ඉස්මත් නමැති පව් හා වැරදි දෑ කිරීමෙන් ආරක්ෂාව වැනි දෑ විශේෂත්වයක් ගන්නේය. නබිවරුන් හා රසූල්වරුන් සියලු දෙනාම කිසිම භේදයකින් තොරව පිළිගෙන විශ්වාසය තැබිය යුතුයි.

මුහම්මද් නබි (සල්) තුමාණන්, අවසාන වූ නබිවරයාය. එතුමාගෙන් පසු කිසිම නබි වරයෙකු පහළ නොවන්නේය. ඔහුගේ දූත මෙහෙවර මිනිස් වර්ගයා සේම ජින්වර්ගයාට ද පොදුය. පරමාන්තය දක්වා එය රැඳී පවතී. නබිවරුන්, රසූල්වරුන් අතුරෙන් ශ්‍රේෂ්ඨවන්තයා මොහුය. මෙතුමා ළඟ සුවිශේෂි වූ ගුණාංගයන් පිරී තිබුණි. එතුමන් ඉස්රා මිඃරාජ් යන අභ්‍යාවකාශ ගමනෙහි යෙදුනහ.

## සහාබාවරුන්

මූඃමිවරුන් අතුරෙන් ශ්‍රේෂ්ඨයන් වන්නේ සහාබාවරුන්ය. නබිවරුන්ට පසු උසස් වූ තැනක වැජඹෙන්නේ මොවුන්ය. මොවුන් අතරින් ස්වර්ගය හිමි බවට සුභපැතුම් ලැබූ සහාබාවරුන් දස දෙනෙක් සිටිති. "අහ්ලුල් බෙත්" නමින් හඳුනන නබි (සල්) තුමන්ගේ පවුලත්, මූඃමින්වරුන්ගේ මව්වරුන් වන එතුමාණන්ගේ භාර්යාවරුන් ද ගරු කළ යුතුයි. ඔවුන්ට සෙනෙහස පෑ යුතුයි. තවද, සහාබාවරුන් සියලු දෙනා විශ්වාසනිය, අවංක සත්පුරුෂයන් බවද අහ්ලුස්සුන්නාහ් වල්ජමාආ අකීදාවෙහි විශ්වාසය වේ.

සහාබාවරුන් අතර අබූබක්කර් (රලි), උමර් (රලි), උස්මාන් (රලි), අලි (රලි) පිළිවෙලින් ශ්‍රේෂ්ඨවන්නේය. ඔවුන්ට දෙස් පැවරීම නොමනාය. ශාප කිරීම මහත් පාපයෙකි. අපේ නායකයන් හා මග පෙන්වන්නන් ඔවුන්ය.

## වලිවරුන්

අල්ලාහ් ගේ සෙනෙහවන්තයන් "වලිවරුන්" වන්නේය. අල්ලාහ් තමන්ට අභිමත අයට විශේෂ ආශිර්වාදයන් පුද කරන්නේය. වලිවරුන්ගේ "කරාමත්" (හාස්කම්) නමැති හාස්කම් සත්‍යය. ගැත්තන් අතුරින් ඔහු මොනයම් ආධ්‍යාත්මිකත්යෙන් පසු වුවද ඔහුට මූලික වූ ආගමික වගකීම් වලින් බැහැර වන්නට බැරිය. හරාම් දෑ කිසිවෙකුටත් හලාල් නොවනු ඇත. පාපයන්හි නිරතවීමටද අනුමැතියක් නැත.


අප විශ්වාස කළ යුතු ප්‍රධාන කොටස් හයක් ගැන පෙර පන්තිවල ඉගෙන ගතිමු. මෙහි අප ඒ හා සම්බන්ධ සමහර විශේෂ කොටස් කෙරෙහි අහ්ලුස්සුන්නාහ් වල්ජමාආවෙහි ස්ථාවරය තේරුම් ගතිමු. මෙය අපගේ විශ්වාසය වේ. මෙම විශ්වාසය හා ගැටෙන නොයෙකුත් සිද්ධාන්ත හා කොටස් තිබුණද එවන් දෑ වැරදි හා මංමුලා වූ කොටස්ය.

**අභ්‍යාසය**

1. ඉල්මුල් අකීදා යනු කුමක් ද?
2. අල්හුස් සුන්නාහ් වල්ජමාආ යන්නෙහි අර්ථය කුමක් ද?
3. නබි ඉබ්රාහිම් (අලෛ) තුමා ගැන අල්කුර්ආනයේ සඳහන් ව ඇති වාක්‍ය සඳහන් කරන්න.
4. පහත සඳහන් වචන විස්තර කර ලියන්න.
   i. මලායිකාවරු
   ii. අල්කුර්ආන්
   iii. අකුසල්
   iv. කියාමතය
   v. රිසාලත්
   vi. සහාබාවරු
   vii. වලිවරු

# 1.3 ජීවිතයෙහි ඊමානයේ බලපෑම්

ඊමාන් යන්නෙහි තේරුම විශ්වාසය වන්නේය. මිනිසාගේ හදවත තුළ සඟවා තබා ගත යුතු ප්‍රතිපත්තියක් නොවන ඊමානය දේව අනපණත්වලට යටත්ව, මිනිසාව ක්‍රියාත්මක කරන්නක් වශයෙන් ඊමානය හැඳින්විය හැක. සිතින් අදිටන් කර, මුවින් පවසා, සිරුරෙන් ක්‍රියාත්මක කර අල්ලාහ්ට ළඟාවීමේ මාර්ගය ඊමාන් වන්නේය.




* ඊමාන් මුජ්මල් යනු කෙටි ඊමානය වන්නේය. උද : ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්
* ඊමාන් මුෆස්සල් යනු පුළුල් ඊමානය වන්නේය.
  උද : ආමන්තු බිල්ලාහි ................. යන්නෙහි එන අල්ලාහ්ගේ දේවදූතයන්, ආගම්, රසූල්වරු කියාමාව, කද්ර් යනාදිය පිළිබඳ විශ්වාසය තැබීමයි.

ඊමානය: ජීවන රටාවෙහි බලපෑම් ඇති කරයි. එම බලපෑම්, ඔහුගේ ක්‍රියාකාරකම්වල පිළිබිඹු වන්නේය.

ඊමානයේ ප්‍රධානම කරුණ තව්හීද් වන්නේය.

අල්ලාහ් සිටින්නේය. ඔහු ඒකයාය. නැමදුමට හා අවනත වීමට සුදුස්සාය යන මේ විශ්වාසය, අල්ලාහ් හැර වෙන කිසිවෙකුට වැඳීමෙන් වැළකීමටත් නිවහල්ව ජීවත් වීමටත් හේතු වේ.

අල්ලාහ් ශුද්ධ වූ නාම, ගුණාංග, හැකියාවන් සහ ක්‍රියාවන් යනාදිය පැහැදිලිව තේරුම් ගත් මුඃමින්වරයෙකු අල්ලාහ් හැර අන් කිසිවෙකු ළඟත් ප්‍රාර්ථනා නොකරයි. අල්ලාහ් ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගත් ඔහු අල්ලාහ්ගේ ඕනෑ එපාකම් අනුව ක්‍රියා කරයි. ඔහු අප්‍රිය කළ දෙයින් ඉවත් වෙයි. අල්ලාහ්ගේ තෘප්තිය පතා දිවා රෑ වෙහෙසෙයි. ඔහුගේ කටයුතුවල ජය හෝ පරාජය ලැබුවද එය අල්ලාහ්ගේ පූර්ව විනිශ්චය අනුව සිදුවූවැකැයි සිතා සැනසෙයි ඊමානයෙහි ඊළඟ වැදගත් අංගය වන්නේ රිසාලත් පිළිබඳ විශ්වාසය යි.

ඊමානයේ අනෙක් ප්‍රධාන කරුණ නම් ඊසාලනය පිළිබඳ විශ්වාසය වේ. එනම්, අල්ලාහ් මිනිසාව ඔහුගේ නියෝජිතයා වශයෙන් ලෝකයෙහි මැව්වේය. ඔහු ජීවත්වීමට අවශ්‍ය සියළු දේශනා හා මඟ පෙන්වීම් කලින් කලට නබිවරුන්, රසූල්වරුන් හරහා ආගම්, පනත් මගින් පෙන්වා දෙනු ලැබිණ. මේ කරුණු විශ්වාසයට ගෙන මිනිසා, ආගම් හා නබිවරුන් තමාගේ මග පෙන්නන්සේ සලකා කටයුතු කරයි. මෙම ආගම් හා සුහුෆ් මිනිසාට ලබා දීමට අල්ලාහ් ලක්‍ෂයකට වැඩි නබිවරු පිරිසක් තෝරා ගත්තේය. ඔවුන්ගෙන් 313 ක් රසූල්වරුන් වේ. ඔවුන්ගෙන් 25 දෙනෙකුගේ නාමයෙන් කුර්ආනයේ සඳහන් වේ. අවසන් නබිවරයා වන මුහම්මද් (සල්) තුමාගේ වෆාතයෙන් පසු නබිවරුන්ගේ පැමිණීම අහවර වේ. එතුමාගෙන් පසු නුබුවතය අවසන් වන අතර ඉන් පසු කිසිදු ආගමක් හෝ නබිවරයෙකුගේ පැමිණීම අනවශ්‍යය.

අල්කුර්ආනය හා අස්සුන්නාහ් පවසන යහගුණාංග මුඃමින්වරයෙකු විසින් පිළිපදිනු ඇත. ඒවා වළක්වනු ලබන අයහපත් ක්‍රියා වලින් තමාද වැළකී, සෙස්සන්ද එයින් වළකාලයි. ආගමානුකූලව ජීවත් වීමෙන් මොලොව හා පරලොව යන දෙලොවෙහිම සාර්ථක ජීවිතයක් ලබා ගනී. තමා සිදුකිරීමට යන ඕනෑම කාර්යයක් අල්ලාහ් හා ඔහුගේ රසූල්වරයාගේ නියෝගයන් බවද සලකා කටයුතු කරයි.

**ඊමානයෙහි තවත් ප්‍රධාන අංගයක් වන්නේ මරණයෙන් පසු ජීවිතය පිළිබඳ විශ්වාසයයි.**

මිනිස් ජීවිතය මරණයෙන් නිම නොවන්නේය. ලෞකිකව ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳ විමසනු ලැබෙයි. ඒ සඳහා ඔහු උපයෝගි කරගත් ඔහුගේ අවයව, මලායිකාවරුන්ගේ සටහන් ලේඛණ සාක්ෂි වශයෙන් ගෙන එනු ලැබෙයි. මෙය පිළිගත් මුඃමින් පරලොව විනිශ්චයට හා දඬුවමට බිය වී ක්‍රියා කරයි. සියළු මිනිසුන් ඉදිරියේ සිය අකටයුතු ප්‍රසිද්ධවීම ලැජ්ජාවක් සේ සලකයි. එනිසා මුසාවාදය, කේලම්, රසාවස්දස, වංචාව, සූදුව, සුරාව, සොරකම, මත්ද්‍රව්‍ය භාවිතය, ප්‍රචණ්ඩ ක්‍රියා යන අකුසල් ගෙන දෙන ක්‍රියාවලින් වැළැකී සිටියි. අනුන් වෙනුවෙන් නිසිලෙස යුතුකම් ඉටුකර, අයිතිවාසිකම් ද සුරකියි. ප්‍රසිද්ධව හා අප්‍රසිද්ධව යහපත් දේම සිතයි. අයහපත් දේ පිළිකුල් කරයි. ලෝකවාසීන් වර්ණනා කලත්, ගැරහුමට ලක් කළත් පරලොවෙහි යහපත තකා ක්‍රියා කරයි. මේ සියළු දෑ ඊමානය මඟින් ජීවිතයේ ඇති කරන බලපෑම්ය. මුඃමින්වරයෙකු අල්ලාහ් හැර අන් කිසිවෙකුටත් යටත් නොවේ. අල්ලාහ්ට වැඩි වැඩියෙන් අවනත වේ. ඔහුගේ දයාදයන්, කරුණාව, පිහිට ලබා ගැනීම සඳහා ඔහුගේ කාලය හා ශක්තිය කැපකිරීමට මැලි නොවේ. නබිවරුන්ගේ ජීවිත මෙවන් ගුණාංගවලින් පිරි පැවතුනි. සහාභාවරුන්ගේ ජීවිතයත් එලෙසමය. මේ කොටස් අනුගමනය කල අයගේ ජීවිතත් එලෙසම විය.

ඉබ්‍රාහිම් නබිතුමාගේ ජීවිතය දෙස අවධානය යොමු කරන්න. එතුමාගේ ඊමානය පිරික්සීම සඳහා අල්ලාහ් එතුමන්ව නම්රුද්ගේ ගිණිගොඩට දැමීමට සැලස්සුවේය. බිරිඳ හා දරුවන්, උපන් රට, ධනය හා සම්පත් ද අහිමි කරනු ලැබේය. එනමුත් ඔහුගේ ඊමානයේ කිසිදු පලුද්දක් ඇති නොවීය.

"තමා ජීවත්ව සිට ඉස්ලාමයට කැළලක් ඇතිවීමට වඩා ඉස්ලාම් ජීවත්ව සිටියදී තම මරණය උතුම්" යැයි ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) යන උත්තමයා සිය ජීවිතය කැප කළේය. මේ වකවානුවෙහිද ඊමානයෙහි බලපෑමෙන් දිරිමත් වූ උත්තමයන් ජීවිත්ව සිටි බැව් දනිමු. තවද මුස්ලිම් ප්‍රජාව කොතරම් වද බන්ධනයට ලක්වූවත් ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි එල්බ, එහි දැඩිව පිහිටා ජීවිත්වීම ඊමානයෙහි බලපෑම නිසා වන්නේය.

මේ කරුණු සැළකිල්ලට ගෙන අපිද අපේ ඊමානයේ ස්ථිරභාවය රැක ගනිමින් එය ජීවිතයේ පිළිබිඹුවන සේ ක්‍රියා කරමු.

<u>සාරාංශය :</u>

* ඊමානය මිනිස් හදවත් හැඩගසා ක්‍රියාවන් පිරිසිදු කරයි.
* ඊමාන් මිනිස් හදවතෙහි ඇති කරන. ලොකුම බලපෑම "තක්වා" නම් දේව භක්තිය වේ. තක්වාව ලබා ඇති මිනිසෙකු කුර්ආනයේ හා හදීසියේ ප්‍රතිපත්තීන්, ගරු කර අංශුමාත්‍රයක්වත් පටහැනි නොවී ක්‍රියා කරයි. මිනිසා "අල් ඉමානු බිල් ගයිබ්" යන සැඟවනු දෑ පිළිබඳ විශ්වාසය ඉස්ලාමයේ ප්‍රධාන තැනක් ගනී.
* ඊමානය මිනිස් ක්‍රියාකාරකම් සියල්ල පිළිවෙත්වලට හරවයි.
* සියලු පව් වලින් ඊමානය මිනිසා ආරක්‍ෂා කරයි.
  යහපත් ගුණාංග මිනිසා තුළ ඇති කරයි. (ඉවසීම, සැනසීම, වීරත්වය, ධෛර්යය)
* ඊමානය ජීවිතයට අර්ථවත් භාවය හා ආදර්ශයක් ලබා දෙයි.

<u>අභ්‍යාසය</u>

නිවැරදි වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(1) ඊමාන් යනු ............................................................ යයි අදහස් වේ.

(2) ඊමානය (1) ........................................... (2) ...................................... යයි කොටස් දෙකකට බෙදගත හැක.

(3) ඊමානයෙහි ප්‍රධානතම අංශය ...................................................... වන්නේය.

(4) ගිනි ගොඩෙහි දමනු ලැබූ නබිතුමා ................................................ විය.

(5) ඉමාම් .................................................. තුමා ඉස්ලාමයට කැළලක් ඇති වීමට වඩා තමා මිය යෑම වැදගත් යයි සිතුවේය.

# 1.4 ඊමානයට පටහැනි අංගයන්

ඉස්ලාමයේ කටයුතුවලට වින කරන බොහෝ දෑ දක්නට ලැබේ. එවන් දෑ ඊමානයට පටහැනිවන්නේය. කුෆ්ර්, ෂිර්ක්, රිද්දත් යන වචනයන්ගෙන් මෙවන් කොටස් හැඳින්විය හැක.

තව්හීදයට වින කරන සියලුම දෑ ෂිර්ක් වශයෙන් හැඳින්වේ. ඊමානයට වින කරන සියලු කටයුතු කුෆ්ර් යැයි හැඳින්වේ.

## ෂිර්ක්

මෙය සම්පූර්ණයෙන්ම තව්හීදයට පටහැනිය. මෙහි අර්ථය ආදේශ කිරීම, සමාන කිරීම, හවුල් කිරීම යන්නයි. ඉස්ලාම් අල්ලාහ් පිළිබඳ ඉතා පැහැදිලි වූ ප්‍රතිපත්තියක් ලබා දෙයි. ශක්තිවන්තයා ලෙස. ඒකයා ලෙස, මැවීම්වල අවශ්‍යතාවයන්ගෙන් මිදුනු කෙනෙක් ලෙස, පරපුරක් නොමැත්තා ලෙස, ආදේශයක්ද නොමැත්තෙකු ලෙස අල්ලාහ්ව හඳුන්වා දෙනු ලබයි. මෙවන් පවිත්‍ර වූ දේව විශ්වාසයන් කඩ වන තත්ත්වයක ෂිර්ක් ඇති වේ.


අල්ලාහ්ට ආදේශ වශයෙන් තව දෙයක් ගෙන ඒම, ඔහුට සහායකයෙක් පිළිගැන්වීම, ඔහු වැනි තවත් කෙනෙකු සිටිතැයි විශ්වාස කිරීම, ඔහුගේ ගුණාංගයන්ට තව එකක් එකතු කිරීම, ඔහු සමඟ තවත් දෙවි කෙනෙකු ඇදහීම, තව දෙවි කෙනෙකු ලඟ උපකාර පැතීම හා සෙනෙහස දැක්වීම, ෂිර්ක්වල අන්තර්ගතය වන්නේය. මෙසේ ෂිර්ක්යේ නිරතවන්නා "මුෂ්රික්" යනුවෙන් හැඳින්වේ.

ෂිර්කය අල්ලාහ්ගේ සැබෑ තත්ත්වයට වින කරයි. ඔහුගේ පෞරුෂත්වය, යථාර්ථය, ඒකීයභාවය ආදී කොටස්වලට ෂිර්කය බලපෑම් එල්ල කල හැකි නිසා අල්ලාහ්ගේ සමාව නොලබන වරදක් ලෙස ෂිර්කය හැඳින් වේ.

"ඔබට ඉතා භයානක පවක් දන්වන්නද? යැයි සහාභාවරුන් දෙස බලා නබි (සල්) තුමා ඇසූ විට, "ඔව් අල්ලාහ්ගේ දූතයාණෙනි" යැයි පැවසූහ. එවිට නබි (සල්) තුමා, අල්ලාහ්ට ආදේශ කිරීම හා දෙමව්පියන්ට හිරිහැර කිරීම යැයි පෙරළා පැවසූහ". (අල්-හදීස්)

ෂිර්ක් දෙවර්ගයකි

I ෂිර්කුල් අක්බර්
II ෂිර්කුල් අස්ගර්




"නිත්‍ය වශයෙන්ම අල්ලාහ් තමන්ට ආදේශයන් තබන්නාට සමාව නොදෙන්නේය. මෙය හැර, ඕනෑම වරදක් සඳහා ඔහු ප්‍රියමනාප කරන්නාට කමා කරයි. තවද, යම් කෙනෙකු අල්ලාහ්ට ආදේශ කරන්නෙහිද ඔහු සිටින්නේ මං මුලාවෙහිය". (4 : 116)

යම් කෙනෙකු අල්ලාහ්ට ආදේශ කරන්නෙහිද, අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කර දමයි. ඔහුගේ රැඳවුම් ස්ථානය නිරයයි. මෙවන් පාපිෂ්ඨයන්ට (පරලොවෙහි) කිසිවෙකු හෝ උදව් නොකරයි". (5 : 72)

මෙම කුර්ආන් ආයත් මහා ෂිර්කයට කදිම නිදසුන්ය. ෂිර්ක් හි දෙවැනි කොටස සුළු ෂිර්කය. මහා ෂිර්කය සමඟ සසඳන කල, බැරෑරුම් තත්ත්වයේ නැති වුවද, "කබායිර්" නැමැති මහා පව්වලට වඩා බැරෑරුම් ය. අඛණ්ඩව සුළු ෂිර්කයක යෙදෙන කෙනෙකු තව්බා (පසුතැවිලි පව් සමාව) නොකරන තත්ත්වයේ කාෆිර්වරයෙකු ලෙස මිය යන්නට හැකි යයි ඉස්ලාමීය නීතිවේදීහු පෙන්වා දෙති.

## කුෆ්ර්

කුෆ්ර් යන්න සැඟවීම, ප්‍රතික්ෂේප කිරීම යනුවෙන් අදහස් කෙරුවද, යම් කෙනෙකු අල්ලාහ් හා සිය දූතයාගේ නිසි මාර්ගය පිටු දැක ජීවත්වීම කුෆ්ර් සැඟවේ. මේ නිසා කුෆ්ර් යනු දේවත්වය පිටු දැකීම යනුවෙන්ද හැඳින්වේ.

කුෆ්ර් යනු ඊමානයේ විරුද්ධ පදයකි. "ප්‍රතික්ෂේප කිරීම" මෙහි අර්ථය වේ. අරාබි ව්‍යවහාරයට අනුව වැසීම හා තිරදැමීම යන අර්ථය ගෙන දේ. ඉස්ලාමීය ස්වභාවයෙන් ඉපදුනු මිනිසා තම ස්වභාවයට තිර දමා සිටීම නිසා කාෆිර් යනුවෙන් හැඳින්වේ.

කුෆ්ර් ඇතිවන ක්‍රම තුනකි. එනම්,

I. විශ්වාසය සම්බන්ධ කුෆ්ර්
II. වාචිකව සිදුවන කුෆ්ර්
III. ක්‍රියා මගින් සිදුවන කුෆ්ර්

### I. විශ්වසය හා සම්බන්ධ කුෆ්ර්

ඉස්ලාමීය විශ්වාසනීය මූලධර්මවලට පටහැනි සියලු විශ්වාස මෙහි අඩංගු වේ. කුෆ්ර් ඇති කරන මෙවැනි විශ්වාසවලට නිදසුන් පහත සඳහන් වේ.

1. අල්ලාහ් පිළිබඳ විශ්වාසයට අදාලවන කරුණු.
   - (අ) මැවුම්කරුවෙකු නැතැයි යනුවෙන් විශ්වාස කිරීම.
   - (ආ) අල්ලාහ්ට තිබිය යුතු ගුණාංගයන්ගෙන් එකක් ප්‍රතික්ෂේප කිරීම.
   - (ඇ) අල්ලාහ්ට නොතිබිය යුතු ගුණාංගයක් ඔහු කෙරෙහි ඇතැයි විශ්වාස කිරීම.
2. නබිත්වය පිළිබඳ විශ්වාසයට අදාල කරුණු
   - (අ) කිසියම් නබිවරයෙකු ප්‍රතික්ෂේප කිරීම.
   - (ආ) මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ රිසාලතය ප්‍රතික්ෂේප කිරීම.
   - (ඇ) මුහම්මද් නබි (සල්) තුමාණන්ට පසුව නබිවරයෙකු පහල වෙතැයි විශ්වාස කිරීම.
3. වසංවූ කරණු පිළිබඳ විශ්වාසයට අදාලවන කරුණු
   - (අ) මලායිකාවරුන්, ජින්වරුන් විශ්වාස නොකිරීම.
   - (ආ) පරලොව ප්‍රතික්ෂේප කිරීම.
   - (ඇ) යුක්ති විනිශ්චය, ස්වර්ගය, නිරය, විශ්වාස නොකිරීම.
4. ෂරීඅත් නීතිවලට අදාල කරුණු
   - (අ) අර්කානුල් ඉස්ලාතයේ එකක් හෝ විශ්වාස නොකිරීම.
   - (ආ) පොලිය, ගණිකා වෘත්තිය, මිනීමැරුම් යනාදිය හරාම් බව පිළිනොගැනීම.
   - (ඇ) විවාහ යනාදිය හලාල් වූ දෑ හරාම් යයි සිතීම.

### වචන හා සම්බන්ධ කුෆ්ර්

ඉස්ලාමයට පටහැනි වූ යම්කිසි විශ්වාසයක් දරණ බවට කරන ප්‍රකාශයක් නැත්නම් ඉස්ලාමීය විශ්වාසයක් ප්‍රතික්ෂේප කරන බවට හඟවන ප්‍රකාශයන් මෙහි ඇතුලත් වේ.

අල්ලාහ්ට බැණ වැදීම, නබිවරුන් අපහාසයට ලක් කිරීම්, අල්ලාහ්ගේ නීති සම්පාදනයේ අඩුපාඩු දැකීම් යනාදිය කුෆ්ර් ඇති කෙරේ. මේවා වචන හා සම්බන්ධ කුෆ්ර්වලට කදිම නිදසුන්ය.

### ක්‍රියා හා සම්බන්ධ කුෆ්ර්

කුෆ්ර් බව විදහා දක්වන සෑම ක්‍රියාවක්ම මෙම කොටසෙහි අඩංගු වේ. නිග්‍රහ කිරීමේ අරමුණින් කුර්ආන් පිටපත් ඉරා දැමීම් හෝ කසල ගොඩට දැමීම්, පිළිමයක් අභියසදී පුද පූජා පැවැත්වීම් මෙයට නිදසුන්ය.

ඉස්ලාමයට ප්‍රතිවිරුද්ධ සියලු ක්‍රියාවන් කුෆ්ර් යැයි සැලකීමට ලක්වීම නිසා, එවන් දෑ හඳුනාගෙන තම ජීවිතයන් හැඩගස්වා ගන්නා ලෙස ඉස්ලාම් ආයාචනය කරයි.

කුෆ්ර් මගින් මිනිසෙකු ඔහුගේ ඊමානය නැතිකර ගනී. ඔහුගේ කිසිම කුසලයක් අල්ලාහ් විසින් අනුමත නොකෙරෙයි. තව්හීද් මගින් අත්කරගත හැකි සියලු ආනිසංශ කුෆ්ර් මගින් අවංලගු කරයි. මෙම තත්ත්වයේදී මරණය ලඟාවුවහොත් ඔහුට නිරය අනිවාර්ය වේ. මෙවන් හානි කර දෑ කුෆ්ර් තත්ත්වය මගින් ඇති වේ.

## රිද්දත්

රිද්දත් යන පදයට ආපසු යාම, නැවත හැරීම, පෙර සිටි තැනට පසුබෑම යනුවෙන් අදහස් කළ හැකිය. වර්තමානයෙහි ඉස්ලාම් ආගමෙන් බැහැර වී වෙනත් ආගමක් ඇදහීම රිද්දත් වන්නේය. ඉස්ලාමීය භාවිතයෙහි මුස්ලිම්වරයෙකු කුෆ්ර් හා ෂිර්ක් ක්‍රියාවක් සිතීම, ප්‍රකාශ කිරීම, ක්‍රියාවට නැංවීම ස්ථිරවම කළේ නම් රිද්දත් හට ගෙන ඔහු මුර්තද් යනුවෙන් හැඳින් වේ. මුර්තද් කෙනෙකුගේ කිසිම කටයුත්තක් අල්ලාහ් විසින් අනුමත කරනු නොලබයි. මුස්ලිම් සමාජය සමඟ මොහුගේ සම්බන්ධතාවය බිඳී යයි. මොහුගේ භාර්යාව ඉබේම දික්කසාද වෙයි. මොහුව ඉමාම් කර නැමදුමෙහි යෙදීමට නොහැකිය. මෙවන් අය තව්බා කර කලිමාව උසුරා නැවත ඉස්ලාමය වැළඳ නොගත් තත්ත්වයක මියදුනේ නම්, ඔහුව මුස්ලිම් සුසාන භූමියේ භූමදානය කළ නොහැක. ඉස්ලාමීය රාජ්‍යයක මුර්තද්වරයෙකුට මරණීය දණ්ඩනය නියම කරනු ලැබේ.

<u>අභ්‍යාසය</u>

කෙටි පිළිතුරු සපයන්න.

1. තව්හිදයේ විරුද්ධ පදය කුමක් ද?
2. රිද්දත් කොටස් කියකට බෙදිය හැකි ද? නිදසුන් සපයා ලියන්න.
3. කුෆ්ර් යනු කුමක් ද? කුෆ්ර් ඇතිකල හැකි කාර්යයන් මොනවා දැයි සඳහන් කරන්න.
4. ෂිර්ක් යනු කුමක් ද?
5. මහා ෂිර්ක්, සුළු ෂිර්ක් නිදසුන් සමඟ පහදන්න.
6. මුර්තද් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?